Berghof
Research Center
Forschungszentrum
for Constructive
für konstruktive
Conflict Management
Konfliktbearbeitung

# නිරාකරණයේ සිට ව්‍යාවර්තනය කරා: සංවාද ව්‍යාපෘතීන්හි කාර්යභාරය

නෝර්බට් රෝපර්ස් (Norbert Ropers)






1. හැඳින්වීම 324

2. සංවාද විධිමත් කිරීමේ ප්‍රවේශ 325

3. ප්‍රසාම යත්නයන්වල පවතින සංවාද ව්‍යාපෘති 329

 පහළ තලයේ සාමය ගොඩනගන්නන් ලෙස සංවාද ව්‍යාපෘතීන්

 අන්තර් පුද්ගල නිරාකරණ ව්‍යාපෘති ලෙස 329

 සංවාද ව්‍යාපෘතීන්, පුද්ගල සහසම්බන්ධතා වර්ධනය සමග ඒකාබද්ධ කිරීම 330

 සංවාද ව්‍යාපෘතීන්, ආයතන ගොඩනැගීම, ප්‍රතිසංස්කරණය සහ ප්‍රායෝගික

 ව්‍යාපෘති සමග ඒකාබද්ධ කිරීම 330

 සංවාද ව්‍යාපෘතීන් පෙර-ගිවිසුම් ලෙස 330

4. අර්බුද කළමණාකරණයේ මෙවලම් අනුව සංවාද ව්‍යාපෘති 331

5. උගත් පාඩම් 335

6. ආශ්‍රිත ග්‍රන්ථ 339


©2006 Berghof Research Center for Constructive Conflict Management

# නිරාකරණයේ සිට ව්‍යාවර්තනය කරා: සංවාද ව්‍යාපෘතීන්හි කාර්යභාරය

නෝර්බට් රෝපස් (Norbert Ropers)

## 1. හැඳින්වීම

සංවාද යනු අර්බුද හා ධනාත්මකව කටයුතු කිරීමේ එක ම සම්භාව්‍ය මාර්ගය නොවේ නම්, එක් මාර්ගයක් ලෙස, සඳහන් කළ හැකිය. මේ පිළිබඳව එක් තර්කයකින් කියැවෙන්නේ "ඔබ සාකච්ඡා කරන තාක් ඔබට වෙඩි තැබිය නොහැකිය"යන්නයි. "සංකීර්ණ ප්‍රශ්නයක් විසඳීමේ දී මෙයට වඩා හොඳ ක්‍රමයක් තිබේ ද," තවත් පහළ මට්ටමේ නිරීක්ෂණයකින් කියවෙන්නේ, "අවංක අදහස් හුවමාරුවකට මීට වඩා හොඳ ක්‍රමයක් තිබේද?" සහ, ආචාරධර්ම සංවාදයකින් කියවෙන්නේ, "ස්වාධීන සහ සංවර්ධිත ලෝකයේ විවිධාකාර දේශපාලනික සහ සදාචාරාත්මක අර්බුද සඳහා ස්ථිරසාර විසඳුමක් සෙවීමේ දී විපතට පත් පාර්ශ්වයන් අතර ප්‍රායෝගික සංවාදයකට වඩා වෙනත් මාර්ග තිබේ ද" (ඒපල් 1990) යන්නයි.

දේශපාලන බලාධිකාරියේ සහ ප්‍රායෝගික දේශපාලනීකරණයේ අඩුපාඩු මගින් නිල '1 පථය' වන රාජ්‍යෝපායයෙහි ලා සාකච්ඡාමය හැකියාවන් අඩුවශයෙන් මහජනයා දකින පරිදි නිතර ම පාහේ පසුබිමකට තල්ලු කර දැමීමක්, පැවතුණත් සාම්ප්‍රදායික රාජ්‍යෝපාය පිළිබඳ ක්ෂේත්‍රයේ දී සාකච්ඡාමය හැකියාවන් ප්‍රායෝගික අන්තර්ජාතික සබඳතා කළමනාකරණ ක්‍රියාවලියේ මූලික අංගයක් වෙයි. එසේ වුවත්, නිල නොවන '2 පථය' නියෝජිතයෝ සන්නිවේදනය, සෘජු ගනුදෙනු සහ අන්‍යෝන්‍ය අවබෝධය පිළිබඳ සංකල්ප කේන්ද්‍ර ස්ථානයේ ලා සලකති. අඛණ්ඩව, සංඛ්‍යාත්මකව වර්ධනය වන තීව්‍ර හෝ ප්‍රචණ්ඩකාරී විභවයක් සහිත විසංවාද මගින් තව දුරටත් පෝෂණය වන මෙවැනි නිල නොවන සාකච්ඡාමය ප්‍රවේශයන් සඳහා වන උනන්දුව, විශේෂයෙන් ම වාර්ගික දේශපාලනමය සහ දීර්ඝ කාලීනව දිග්ගැස්සෙන ඒවා, සමාජය තුළ වැඩි වශයෙන් දක්නට ලැබේ.

පහළ බිම් මට්ටමේ සිට ඉහළ නායකත්ව තලය දක්වා වූ සංවාද ව්‍යාපෘති රැසක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ සියල්ලක් ම ගැටුම් නිරාකරණය හෝ සමථය හෝ බලපෑම් කිරීම සඳහා නිර්මාණය වී ඇත. එහෙත්, මේ ප්‍රවණතාවයට එරෙහිව විවේචන නැත්තේ නොවේ. මෙහි දී කෙරෙන එකම යහපත් දෙය, අර්බුදයකට මැදිහත්වී සිටින පාර්ශ්වයන්ගේ මධ්‍යස්ථ මතධාරී නියෝජිතයන් නීතියක් ලෙස, මේසයක් වටා ඒකරාශී වීම නම් ඉන් ඇති ඵලය කුමක් ද? වැඩමුළුවක හෝ වැඩමුළු මාලාවක රාමුවක් තුළ, බලපෑම් කළ හැකි පුද්ගලයන් අතර එකඟතාවක් හෝ අවබෝධයක් ලබා ගත්තත් ඉන් ඔබ්බට එහි පසු විපරම් කටයුතු කළමනාකරණය කිරීම මත එම ක්‍රියාදාමයේ සමස්ත සාර්ථකත්වය රඳා නොපවත්නේ ද?

අවසාන වශයෙන්, සංවාද ක්‍රමවේදයට අනුගතවීම මගින් සංවාද ක්‍රමයේ අනුගාමීහු අර්බුද ගැන කටයුතු කිරීමේ දී සන්නිවේදනයේ වැදගත්කම මූලික වශයෙන් අධි තක්සේරු කිරීමේ

අවදානමකට මුහුණ නොපාත් ද? බොහෝ අර්බුදවල අවසාන සැලකිල්ල වන්නේ, ගතානුගතික සංකල්ප හා අදහස්වල විවිධාකාර භාව සහ විවිධාකාර සංස්කෘතිමය තත්ත්වයන් නොව, ප්‍රකටව විද්‍යමාන වන අපේක්ෂාවන් හි පරස්පරතා, ව්‍යූහාත්මක සාධක සහ බලය හා බලපෑම් කිරීම සඳහා වන අරගලය යි. එසේ නම්, මෙකී සංවාදය අර්බුදයේ සහ අර්බුද ව්‍යාවර්තනයේ සමස්ත ගතික සන්දර්භය තුළ ස්ථාපිත කළ යුතු බව හැඟී යයි.

බොහෝ විද්වතුන් සහ ක්‍රියාකාරීන් එකඟ වන අන්දමට දිගුකල් පැවති ගැටුම් නියත වශයෙන් ව්‍යාවර්තනය කළ හැකි වන්නේ ඒවායේ ව්‍යූහාත්මක හේතු සහ අර්බුදයේ බලාත්මක දේශපාලන ප්‍රභේදයන් පිළිබඳ ප්‍රශ්නවලට විසඳුම් සෙවීමෙන් පමණි; එසේ වන්නේ එම අර්බුදවල මනෝසමාජීය පැතිකඩ, දුක් ගැනවිලි සහ සම්බන්ධතා පිළිබඳ ගැටලුවලට අමතරවයි. පැහැදිලිව ම, සන්නිවේදනය සහ පුද්ගල අදහස් හුවමාරුවකට ඇති උනන්දුව නිසා, මනෝ-සමාජීය අර්බුද ව්‍යාවර්තන ක්ෂේත්‍රය තුළ මූලික මෙවලමක් ලෙස සංවාදවලදී භාවිතයට ගැනේ. මේ නිසා, ඒ අන්දමින් ඉතා පටු ආකාර වූ සංකල්පමය සන්දර්භයක් තුළ නිර්වචනය කිරීමක පිහිටා ඒවායේ වැදගත්කම මෙහි දී අගය කරනු ලැබේ.

මේ නිසා, ඉදිරියේ දී විවිධත්වය සහ බලපෑම් පුළුල් ආකාරයෙන් විස්තර කර දක්වමින් සංවාද ව්‍යාපෘතීන් හි මූලික විශේෂාංග සමහරක් පරීක්ෂාවට භාජනය කිරීමට මම අපේක්ෂා කරමි. පළමුව 'අභිරූපය සංවාද' පිළිබඳ විස්තරයක් සපයා, එහිදී බොහෝ සංවාද ක්‍රියාදාමවල මූලික කරුණු කීපයක් හඳුන්වා දෙමි. දෙවනුව, සාකච්ඡාමය ක්‍රියාදාමයන්හි පවතින ප්‍රවර්ග හතරක වෙනස හඳුනා ගැනීමට මම උත්සාහ කරන අතර, එම ව්‍යාපෘතීන් හි ප්‍රායෝගිකත්වය මූලික වශයෙන් පැහැදිලි කිරීමට උත්සාහ ගන්නෙමි. තෙවනුව, සාර්ථකත්වය මැන ගැනීමේ මනා ක්‍රියා පටිපාටියක් පැහැදිලි කරනු සඳහා අර්බුද හැසිරවීම සඳහා ඇති බහුවිද ප්‍රවේශ සන්දර්භය තුළ සංවාද ව්‍යාපෘතීන් පැහැදිලි කරනු ලැබේ. සිව්වනුව, මෑතක සිදු වූ තක්සේරුගත අධ්‍යයන රැසකින් උගත් පාඩම් කීපයක් මම විස්තර කරන්නෙමි. ඉහත සඳහන් ප්‍රශ්න පිළිබඳ ව සාකච්ඡා අවසාන වශයෙන් සිදු කරනුයේ මෙම පරිච්ඡේදයට පදනම් වී ඇති අත්දැකීම් හුවා දක්වමිනි.

## 2. සංවාද විධිමත් කිරීමේ ප්‍රවේශ

සංවාද බෙදා වෙන්කර දැක්වීමේ ක්‍රම දෙකක් මෑතක දී පළවූ පොතපතෙහි අවධානයට ලක්කෙරේ: පළමුව, අභිරූපීය ප්‍රකාරයන් හඳුනා ගැනීම සහ දෙවනුව ධනාත්මක සංවාද ප්‍රවේශයක් සඳහා සන්නිවේදනයේ සහ අදහස් හුවමාරු කරගැනීමේ පියවර අනුව එහි විවිධාකාර අවස්ථා වෙන්කර ගැනීම වේ.

අන්තර් - කණ්ඩායම් ගැටුම් සඳහා සංවාද ප්‍රවේශ තුනක් ජේ. රොත්මාන් (1998) විසින් අභිරූපීය ප්‍රකාරයන් ලෙස දක්වා ඇත:

- අදහස් හුවමාරු කිරීම පිළිබඳ බහුලව පවතින ක්‍රමවේද සංවාද යන නාමයට සුදුසුදැයි සැක සහිතය; *ස්ථානීය* සංවාදයක දී පාර්ශ්වයන් තම තමන්ගේ අදහස් ප්‍රකාශයට පත් කරන අතර මේවා වෙනස්කම්වල සිට දැඩි විරුද්ධ මත දක්වා විහිදෙයි. ඒ සඳහා වශයෙන් අවශ්‍ය වන්නේ අවම

පිළිගැනීමක් සහිත ආකල්ප සහ ප්‍රවේශයන්ය. පාර්ලිමේන්තු විවාදයක මෙන්, එක් අදහසක් අනෙක් අදහස පරයා නැගෙන බැවින් සන්නිවේදනය මෙහි මූලික අරමුණක් ලෙස ලකුණු එකතු කිරීමකට සමාන වේ.

- *මානව සම්බන්ධතා* සංවාදවල දී පුළුල් ප්‍රශ්න පිළිබඳ අදහස්වල විවිධත්ව දෙවැනි තලයකට යොමු කරනු ලැබේ. ඒ වෙනුවට, පාර්ශ්වයන් අතර සාමාන්‍යයෙන් මතුවන අනවබෝධතා සහ ගතානුගතික තත්වයන් ගැන අවධානය යොමු කරමින් සංවාද සාපෙක්ෂ මට්ටමින් කරනු ලැබේ. මෙබඳු සංවාදවලට පෙරාතුව කණ්ඩායම් තුළ එකිනෙකා හඳුනා ගැනීම හා අන්තර් ක්‍රියාකාරීත්වය සඳහා සූදානම් වීමේ පෙරහුරුව පැවැත්වේ. අනෙක් පාර්ශ්වය සම්බන්ධයෙන් ගරු කිරීම සහ අන්‍යෝන්‍ය පිළිගැනීම මෙහි අරමුණයි. අර්බුදය හා සම්බන්ධයෙන් මෙමගින් කිනම් ආකාරයෙන් බලපෑම් ඇති කරයි ද යන්න විවෘත ප්‍රශ්නයකි.
- *ක්‍රියාකාරීන්ගේ සංවාද සාකච්ඡාවන්* තවත් පියවරක් ඉදිරියට යයි. පොදු එකඟතාවක් හඳුනා ගැනීම සහ ගැටලුව සහිත ඇති විෂයයන් වෙන් කර හඳුනාගෙන විශ්ලේෂණය කරනු ලැබේ, සහ/හෝ මෙය සිදුකෙරෙන්නේ ඒකාබද්ධ ක්‍රියාදාමයක් මගින් පාර්ශ්වයන් සිය අර්බුද ඒ සඳහා ඇතුළු කරන්නේ කෙසේ දැ යි සොයා බලනු පිණිසය.
- වඩා අධිෂ්ඨානශීලී ප්‍රවේශය වන්නේ *ගැටලු නිරාකරණ* සංවාදයන් ය. මෙහිදී ප්‍රශ්නයට මැදිහත්වූවෝ එකිනෙකා අතර ඇති වෙනස්කම්වල ඇති අන්තර්ගතය ක්‍රමානුකූලව සලකා බලමින් කටයුතු කිරීම තුළින් සිය සන්නිවේදන කටයුතු සංවිධානය කර ගනිති. අර්බුදය දරුණු අතට හැරී ඇත්නම් මෙ වැනි සාකච්ඡාවක දී, සම ක්‍රියාකාරිකයෙකු හෝ ආරම්භකයෙකු වශයෙන් තෙවැනි පාර්ශ්වයක සහභාගීත්වය වැදගත් වේ.

දැනට පවතින අදහස් හුවමාරු කර ගැනීමේ මට්ටම අනුව සාකච්ඡාවක් හඳුනා ගැනීමේ දී මෙම ප්‍රවේශයේ ප්‍රයෝජනයට වඩා වැඩි යමක් සිදු වෙයි. එක් ව ගත් විට, ඒවායින් අවධාරණය වන්නේ සංවාද මගින් ගැටුමක් පිළිබඳ අර්ථවත් අයුරින් ක්‍රියා කිරීමට අදාළ වෙනස් එහෙත් අනුපූරක කරුණුයි. මෙහි නවීකරණය කරන ලද ක්‍රමවේදයක් අනුව සංවාදයේ පාර්ශ්වකරුවන් අතර අදහස් හුවමාරු කිරීමේ සහ සන්නිවේදනයේ ගුණාත්මක භාවය වැඩි කිරීමේ ක්‍රමවේදයක පියවර ලෙස විවිධාකාර ලක්ෂණයෙන් යුතු සංවාද විධි මෙහිදී උපකල්පනය කළ හැකිය (1 වන රූපය බලන්න). සන්නිවේදනය මගින් අර්බුද සඳහා ප්‍රතිචාර දැක්වීමේ සිව් වැදෑරුම් අවස්ථා සහිත ක්‍රමවේදයක් අර්බුද විසඳීමේ විකල්ප ව්‍යාපාරයේ අනුගාමිකයන් විසින් ඉදිරිපත් කර ඇත.

- විවිධ පාර්ශ්වවල ඇති *විපරීත දෘෂ්ටිකෝණ* සකස් කර ගැනීම පළමුවන අදියරේ දී සිදු කෙරේ. එය වඩාත් පැහැදිලි ආකාරයකට, ඒ සඳහා අන්‍යෝන්‍ය එකඟතාව ඇති කරගනිමින් සහ ගැටුමේ අන්තර්ගතයන් හඳුනා ගනිමින් සිදුවිය යුතුය.
- මෙහි දෙවැනි අදියරේ ඉලක්කය වන්නේ සහභාගී වන ක්‍රියාකාරීන්ගේ වටිනාකම්, ගැටුම සම්බන්ධයෙන් අත්දැකීම් සහ ඔවුන්ගේ අපේක්ෂාවන් පිළිබඳව සැඟවී ඇති අවශ්‍යතාවන් සහ භය සංකාවන් පිළිබඳ මෙනෙහි කිරීමයි. නියම වශයෙන්, මෙම අවස්ථාවේ දී අනෙක් පාර්ශ්වයේ අර්බුදකාරී පුද්ගලයන්ගේ

චරිත පිළිබඳ පෞද්ගලික මට්ටමෙන් අවබෝධයක් ලබා ගැනීමට ද හැකියාවක් ඇත.

- තෙවැනි අදියර වෙන් කෙරෙනුයේ පොදු අපේක්ෂා, සහ එවැනි අවශ්‍යතා හා සැක සංකා හඳුනා ගැනීම සඳහා ය. අවම මතභේදයකට තුඩු දෙන කාරණා පිළිබඳව සහයෝගීතාවක් ඇති කර ගැනීම ද මෙහි දී ඉලක්ක කරගත හැකිය.
- බොහෝ ප්‍රත්‍යයකයන්හි සිව්වැනි අදියරේ පෞද්ගලික මට්ටමේ විශ්වාසය ගොඩනැගීමේ පියවර හා දිගුකාලීන සැලසුම් කටයුතු සිදු කෙරේ. ප්‍රවේශයන් සාකච්ඡා කිරීම සහ අර්බුදයේ පුළුල් ප්‍රශ්නවලට විසඳුම් සෙවීම මෙයට අදාළ වේ. එය *ආරවුල පිළිබඳ ප්‍රධාන ගැටලු නිරාකරණය සඳහා* පාර්ශව සාකච්ඡාව පිණිසත් *විසඳුම්කරණය සඳහා ප්‍රායෝගික ක්‍රියාදාමයන් සකස් කරන්නේ කෙසේ ද* යන්න පිළිබඳවත් කරුණු එයට ඇතුළත් වේ.

රූප සටහන 1: සංවාද ක්‍රියාදාමයක සහයෝගීතා මට්ටම්




මූලාශ්‍රය : මැක් කාට්නි 1986

ඉතා කල්පවතින ගැටලු සම්බන්ධයෙන් අර්බුදයට ලක් වී සිටින කණ්ඩායම් අතර සංවාද ක්‍රියාදාමයන් සංවාද සංසිද්ධී ක්‍රියාදාමයක් ලෙස සකස් කළ යුතුය. සමහර විට එය මාස ගණනක් හෝ විටෙක අවුරුදු ගණනක් ලෙස දිග්ගැසිය හැකිය. පාර්ශ්ව අතර සම්බන්ධතා සහ ඒකාබද්ධ වෑයමේ සාර්ථකත්වය පිළිබඳ එක් ප්‍රධාන ඉලක්කගත කාරණයක් වන්නේ එහි දියුණුව යනු සම්බන්ධතා ගොඩනැගීමේ, ප්‍රශ්න විසඳා ගැනීමේ සහ ඒකාබද්ධතා ක්‍රියාවලියක් ලෙස අර්ථ නිරූපණය කිරීමයි (මැක් කාර්ට්නි 1986).

- සම්බන්ධතාව සහ විශ්වාසය ගොඩනැගීම
- අනෙක් පාර්ශ්වය පිළිබඳව සහානුභූතිය
- ගැටුම් ගැටලු සාමූහිකව විශ්ලේෂණය
- ගවේෂණාත්මක ගැටලු නිරාකරණය
- මෙම සංවාද නිල ගිවිසුම් හෝ පෙර-ගිවිසුම් කරා වර්ධනය කිරීමේ ඒකාබද්ධ ක්‍රියාකාරකම්.

මුහුණට මුහුණලා කෙරෙන සන්නිවේදනයට ඉඩකඩ සලසමින් බොහෝ සංවාද සිදු කෙරෙන්නේ සංවිධානාත්මක *කණ්ඩායම් වශයෙන් ප්‍රතිපක්ෂ වන* ලෙස ය. එය සාමාන්‍යයෙන් සිදු කරනු ලබන්නේ ඉහල නායකත්ව තලයට වඩා පහළින් සිටින පුද්ගලයන් විසිනි. මේ නිසා ඒවා නිල දේශපාලනමය ආරම්භක කටයුතු වශයෙන් නිල ගිවිසුම් හා සම නොවේ. මෙහිදී නීතියක් වශයෙන් මෙම රැස්වීම්වල මූලික ආරම්භය, සංවිධානය සහ ගමන් මාර්ගය තීරණය කරනු ලබන්නේ තෙවැනි පාර්ශ්වයක් විසිනි. මෙම තෙවැනි පාර්ශ්වය පිටරටින් පැමිණීම අත්‍යවශ්‍ය නොවේ; එය ගැටුම් පවතින ප්‍රදේශයේ සිටින මධ්‍යස්ථ පුද්ගලයන් ගෙන් සමන්විත වීමට පුළුවන.

අර්බුදය අති උත්සන්න අවස්ථාවක හෝ විභින්නව ගිය සමාජවල සාමකාමී එකතුවක් සංවිධානය කිරීම අපහසු කටයුත්තකි. මෙහිදී අවම වශයෙන් පළමු අංශයේ ක්‍රියාකාරීත්වය වත් සාර්ථක ව සිදුකර ගැනීමට මැදිහත්කරුවන්ට නොහැකි තත්ත්වයක් පවතී. මෙසේ දිග්ගැස්සුනු ගැටුම්වල දී රැස්වීම් කිහිපයක් පැවැත්වීම අවශ්‍ය විය හැකි අතර, එය ඇතැම්විට පළමු අවස්ථාවටම ආපසු ලිස්සා යමේ ප්‍රවණතාවට ඉඩ දීමට මැදිහත්කරුවන්ට සිදුවෙයි. කාලය ගතවීමත්, ක්‍රියාදාමයේ අස්ථිරතාව සඳහා ඉඩකඩ සැලසීමත්, සාකච්ඡාමය ව්‍යාපෘතිය සංවිධානය කරන්නන් විසින් දැඩි වශයෙන් සැලකිල්ලට ගත යුතු අතර, එහි දී දිගු කාලීන දෘෂ්ටියක ලිහිටා සිටීමත් අත්‍යවශ්‍ය සම්පත් සැපයීමත් අත්‍යවශ්‍යය.

සංවාදය පදනම් වූ රැස්වීම්වල පිටුපස ඇති මූලික අදහස අලුත් දෙයක් නොවේ. අන්තර්ජාතික, අන්තර් සංස්කෘතිකමය අවබෝධය ලබා ගැනීමේ සංන්දර්භය තුළ මෙය ඇති වූයේ 1945 න් පසු යුරෝපයේ ය. ඒ වනවිට එහි මූලික ඉලක්ක කණ්ඩායම වූයේ තරුණ සමාජයයි. විවිධ පසුබිම් ඇති පුද්ගලයන් අතර සන්නිවේදනයක් සහ සම්බන්ධතාවයක් වැඩිකිරීමේ සහ වෛරය සහ ක්‍රෝධය ඉවත් කර, අන්තර් දේශීය හිතවතුන් බිහි කළ හැකිය යන අරමුණ මත පිහිටා මෙම ක්‍රියාමාර්ගය සිදු කෙරිණි. එතැන් පටන්, මෙම "සහ සම්බන්ධතා සංකල්පය" වඩා දියුණු වූ සංකල්පයක් වන "අන්තර් සංස්කෘතිකමය ඉගෙනුම" දක්වා වර්ධනය වී ඇත. (ඔට්ටෙන් ට්‍රෝහීට් 1994).

328

විශේෂයෙන් වාර්ගික දේශපාලනමය අර්බුද සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වන සංවාද පදනම් රැස්වීම් ඉතා මෑතක ඇති වූ සංසිද්ධියක් වන නමුත් ඒවා ද එවැනිම වූ විශ්වාස මත රඳා පවතී. බොහෝ විට එම ක්‍රමයේ වඩාත් බලපෑම් කළ හැකි උපදේශක නිකාය වන්නේ "අන්තර්-ක්‍රියාකාරී ගැටුම් නිරාකරණය හෝ අන්තර්-ක්‍රියාකාරී ගැටලු සමථ" ව්‍යාපාරයයි. (මයිකල් සහ බැන්ක් 1996 : කෙල්මාන් 1992: රොනල්ඩ් ෆිෂර් 1997). මේ ප්‍රවේශයේ ආරම්භය 1960 දශකය දක්වා දිව යයි; එවක විවිධාකාර විද්වත්තු/ක්‍රියාකාරීහු අර්බුද පාර්ශ්වයන්හි බලපෑමක් ඇති කළ හැකි නියෝජිතයින්හට වැඩමුළු සඳහා ආරාධනා කිරීමට පටන් ගත්හ; එය සිදුවුනේ ඉහත සඳහන් කළ සිව් වැදෑරුම් ධනාත්මක සංවාදාත්මක ශාස්ත්‍රීය ක්‍රියාදාමය ඔවුනට මග පෙන්වීම සඳහා යොදා ගනිමින් හෝ එම ක්‍රියාදාමයට පහසුකම් සැලසීම මඟින් ය. මෙම ප්‍රවේශය සම්බන්ධයෙන් අත්දැකීම් මේ වන විට විවිධාකාර අර්බුද ප්‍රදේශවලින් ලබාගෙන ඇත.

එසේ වුවත්, මෙම අන්තර්-ක්‍රියාකාරී ගැටුම් නිරාකරණ මෙවලම ක්‍රමානුකූල ලෙස හා පුළුල් ආකාරයෙන් ක්‍රියාවේ යෙදවීම සිදු වන්නේ අඩු මට්ටමෙනි. ඒ වෙනුවට අර්බුද සඳහා බලපෑම් ඇති කිරීමේ වෙනත් ක්‍රමවේදයන් හා මෙම ප්‍රවේශයේ තෝරාගත් අංග ඒකාබද්ධ කොට භාවිතා කරනු දක්නට ඇත. ඒ පහත දැක්වෙන අයුරිනිඃ

# 3. ප්‍රායෝගික සංවාද ව්‍යාපෘතී

මා දක්නා පරිදි, අර්බුද කලාපවල ප්‍රායෝගික සංවාද ව්‍යාපෘති පිළිබඳව පුළුල් හෝ නියෝජනාත්මක සමාලෝචනයක් සරල මට්ටමින් හෝ මෙතෙක් සිදුවී නැත. මෙම මෙවලම් සමූහයේ ප්‍රයෝජනය සම්බන්ධයෙන් ඇති වාද විවාද මෙතෙක් සීමා වී ඇත්තේ, අවස්ථානුරූපව සලකා ගත් සුවිශේෂිත වූ සංවාදයනට පමණී. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ අන්තර් ක්‍රියාකාරී ගැටුම් නිරාකරණය සමග මූලික වශයෙන් සම්බන්ධ ශාස්ත්‍රීය සංවාද ඇරඹීමයි; මෙහිදී විද්වත්තු/ක්‍රියාකාරීහු තෙවැනි පාර්ශ්වයන් ලෙස එහි ගති ස්වරූප තීරණය කරති.

රාජ්‍ය නොවන සංවිධාන ක්ෂේත්‍රයේ, අනෙක් අතට, සංවාද ව්‍යාපෘතීන් හා සම්බන්ධ වූ අනෙක් ප්‍රායෝගික ක්‍රියාදාම නිර්මාණය කිරීම සඳහා ශක්තිමත් දායකත්වයක් පවතී. එහිදී අරමුණ වන්නේ සුවිශේෂ වූ කණ්ඩායම්වල පොදු අවශ්‍යතා වන (උදා: කාන්තාවන්, තරුණයන්), උපදේශන අවස්ථා (උදා: සාම රැස්වීම්) හෝ පුහුණු කටයුතු මීට අදාළ ය. එවැනි සංවාද ව්‍යාපෘතීන්හි ප්‍රතිඵල සහ මෙහෙයවීම් මත පවතින ලේඛනගත කිරීම මූලික වශයෙන් ශාස්ත්‍රීය ප්‍රවේශයන්ට අදාළ වේ. එමෙන් ම මූල්‍ය දායකයන්ගේ උනන්දුව ද වඩාත පුළුල් ලේඛනගත කිරීමක් සම්බන්ධ අනෙක් ව්‍යාපෘතීන් කෙරේ ද යොමු වී ඇත.

ඉහත සඳහන් කළ සන්නිවේදන අපේක්ෂාවෙන් එපිටට යමින් සමස්ත අරමුණ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින්, මෙම සංවාද ව්‍යාපෘති අතුරින් ප්‍රායෝගික වූ හතරක් නැවතත් තෝරා බේරාගත හැකිය.



## 3.1 සංවාද ව්‍යාපෘති බිම් මට්ටමේ සාම සාධන ප්‍රයත්න හා අන්තර්-පුද්ගල සමගි ප්‍රයත්න ලෙස

එකම තත්ත්වයේ සිටින සහ එකම අපේක්ෂා ඇති (තරුණයින්, කාන්තාවන්, වෘත්තීය සමිති ක්‍රියාකාරින්, ආගමික ක්‍රියාකාරීන් වැනි) පුද්ගලයින් හෝ ප්‍රචණ්ඩකාරී අතීතය නිසා එක ම ඉරණම මත අන්තර් පරායත්තව සිටින සම මට්ටමේ පුද්ගලයින් (යුද්ධයෙන් වැන්දඹු වූවන් සහ අනාථ වූ දරුවන්, හිංසාවට පාත්‍ර වූවන් සහ හිංසාකාරීන්ගේ දරුවන් වැනි) පුද්ගලයින් එකට ඒකරාශී කරන මෙම ව්‍යාපෘතීන් සාමාන්‍යයෙන් දේශීය හෝ අසල්වැසි මට්ටමෙන් සිදු කෙරේ. මෙහි මූලික ලක්ෂණ වන්නේ පෞද්ගලික මට්ටමින් එකිනෙකා හමුවීම සහ සන්නිවේදනය සඳහා ඇති බාධා ඉවත් කිරීමයි. මෙහි මෙහෙයුම්[9] සංකල්පය වනුයේ මානව සම්බන්ධතා සංවාද වන අතර මෙහි දිගුකාලීන අරමුණ වන්නේ මෙවැනි හමුවීම් පුනරුක්ත වීම මඟින් පහළ මට්ටමෙන් සාමය ප්‍රවර්ධනය කිරීමට ඉඩ සලසා දීමයි.

මේ සඳහා විශේෂයෙන් සිත් ගන්නා උදාහරණයක් වන්නේ "මෙනෙහි කිරීම සහ විශ්වාසය" (TRT) සඳහා වූ ව්‍යාපාරයයි මෙ මගින් ආපදාවට පත් දරුවන් සහ එය සිදු කළ අය එකට එක්රැස් කරන අතර එමගින් ප්‍රචණ්ඩ අතීතය පිටු දැකීමේ ක්‍රියාමාර්ග ගැන සොයා බැලේ (බාර්- ඔන් 2000). මෙවැනි බලපෑම් කළ හැකි ව්‍යාපෘතීන් තනි හමුවීමකට වඩා ඉදිරියට යන ප්‍රවේශයන් මත යැපෙන අතර දිගු කාලීන පුද්ගල සම්බන්ධතා ගොඩනැගීම සහ වඩාත් ස්ථාවර පොදු ව්‍යුහයන් සකස් කරයි.

## 3.2 පුද්ගල ශක්‍යතා වර්ධනය හා එක් වූ සංවාද ව්‍යාපෘති

අවබෝධයක් ළඟා කර ගැනීමේ අරමුණක් ඇති සංවාදමය ප්‍රවේශ සලකන විට එකිනෙකා අතර ධනාත්මක අදහස් හුවමාරුවක් පැවතීම සඳහා අවශ්‍ය සහභාගික හැකියා වර්ධනය කිරීම සඳහා මෙම අවස්ථා ප්‍රයෝජනයට ගැනීම අත්‍යවශ්‍ය කාරණයකි. පුහුණුව සහ අර්බුද කළමනාකරණය යන ද්විත්වය සම්බන්ධයෙන් මෙහි දී තවත් වැදගත් කාරණයක් වන්නේ මෙම නියමාකාර හමුවීම් සිය සංවාද හැකියාවන් පිළිබඳව තක්සේරු කිරීම සඳහා ද ඉඩකඩක් ලබා දීමයි. කෙසේ වෙතත් මෙම තාක්ෂණික එකමුතුවීමේ ඇතිවන්නේ අවදානම් සහ හිලව් කිරීම් නැතුව නොවේ. මෙහි පළමු කාරණය වන්නේ, අර්බුදකාරී හමුවීමකට සහ පුහුණුවකට ඉලක්කගත කණ්ඩායම් එකක් වීම අත්‍යවශ්‍ය නොවේ; දෙවනුව, හමුවීම් රාශියක් ඇති විටෙක, පහසුකම් සපයන්නන් විවිධාකාර ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල අරමුණු පැහැදිලි කිරීමට අපහොසත් වුවහොත් එහිදී සහභාගී වන්නන් වික්ෂිප්ත භාවයකට පත් වනු ඇත.

## 3.3 ආයතන ගොඩනැගීම, ජාලකරණය සහ ප්‍රායෝගික ව්‍යාපෘති හා බැඳුණු සංවාදමය ව්‍යාපෘති

මෙවැනි එකමුතුවක් සාමාන්‍යයෙන් ඇති වන්නේ සෑහෙන තරම් දිගුකාලීන විශ්වාසය ගොඩනැගීමේ ක්‍රියාදාමයකින් පසුව වන අතර සංවාදමය අවස්ථා ඉහත කී ආකාරයට ඇති විටය. මෙහි ඇති සුවිශේෂී කාර්යභාරය වන්නේ සංවාද අන්තර් වාර්ගික උපදේශක ආයතන හෝ, සමාදානය ඇති කිරීමේ කොමිසම් හෝ රාජ්‍ය නොවන සංවිධාන ජාලයන් හෝ තනි රාජ්‍ය නොවන සංවිධානවල ශක්‍යතා වර්ධනය මගින් හෝ ආයතනගත කිරීමයි. වෙනත් අවස්ථාවන්වලදී සංවාද ව්‍යාපෘතීන් දේශපාලන ක්‍රියාදාමයකට ආරම්භයක් සපයයි. එම ප්‍රායෝගික ක්‍රියාවලී අතර ජනගහනයේ එක් කණ්ඩායමකට, විශේෂයෙන් අර්බුදය මගින් දැඩිව පීඩනයට ලක්වී ඇති කන්ඩායම්, විරැකියාවෙන් පෙලෙන තරුණ පිරිස් වැනි කණ්ඩායම්වලට ආදායම් ඉපයීමේ මාර්ග සලසා දීම ද වේ.



සංවාදවල ඇති අදාළත්වය වර්ධනය කිරීමේ ව්‍යුහාත්මක වෙනසක් ඇති කිරීමේ විභවයත් අවබෝධ කර ගැනීමේ මනා ක්‍රියාදාමයක් ලෙසට සාමාන්‍යයෙන් මෙය පිළිගැනේ. මෙහි දී නො සලකා හැරෙන කාරණයක් ලෙස පිළිගැනීමට සිදු වන්නේ, මේ ආකාරයේ පසු විපරම් පියවරවලදී වෙනස් ආකාරයේ කොන්දේසි අදාල ක්‍රියාකාරීන් මත පැටවෙන බවයි. එම නිසා, සූක්ෂම අර්බුද පාලනය කොට තැබීමේ බොහෝ ආරම්භක ප්‍රයත්න සාර්ථකවී ඇතත්, පසුව ආයතන ගොඩනැගීමේ අවස්ථාවේ මතුවන මධ්‍යම හා සූක්ෂම-විරෝධතා හමුවේ බිඳී යා හැකිය.

## 3.4 සංවාද ව්‍යාපෘති පෙර-ගිවිසුම් ලෙස

වඩාත් ම අධිෂ්ඨානශීලී සංවාද මත පදනම් කාර්යභාරයන් වන්නේ දේශපාලන නායකත්ව තලයේ ගැටුම් කළමනාකරණය කිරීම සඳහා බලපෑම් ඇති කිරීමට නිර්මාණය කළ ඒවා ය. අදහස් හුවමාරු කරගන්නා ගැටුම් විසඳීමේ සහ ගැටලු විසඳා ගැනීමේ ප්‍රවේශ අරමුණු කරගනිමින් විශ්වාසය නංවන වැඩමුළු පැවැත්වීමෙන් අරමුණු කරගන්නේ මෙයයි. එම ප්‍රවේශවල දී එවැනි ක්‍රියාදාමයන් පසුකාලීන

නිළ සාකච්ඡාවක් සඳහා නව ජීවයක් ද පහසුකම් සැලසීමක් ද වේ යැයි යන අරමුණින් තෙවැනි පාර්ශ්වයක්, එහි බලපෑම් කළ හැකි සාමාජිකයන් වන, විශේෂයෙන් ම අර්බුදයට මැදිහත් වූ පාර්ශ්ව අතර අදහස් හා ගැඹුරු අවබෝධයක් ඇති කරන්නේ කෙසේ ද යන කාරණය සම්බන්ධයෙන් කටයුතු කරනු ඇත. එම ප්‍රවේශය ඇතැම් විට පෙර ගිවිසුම් අවස්ථාවක් ලෙස ද සලකනු ලැබේ. මෙවැනි උත්සාහවල ප්‍රායෝගික ප්‍රතිඵල ඇගයුම් කිරීමේ දී එහි බලපෑම් මුල දී බෙදා වෙන් කෙරුණේ බාහිර හෝ අභ්‍යන්තර වශයෙන් පමණි. එනම්, ගැටුමට සෘජුව සම්බන්ධවූවන් වෙත හෝ අර්බුදයේ පුළුල් සන්දර්භය තුළ බලපෑම් ඇති කිරීමත් ය. මේ වන විට, කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් අද පවතින සාකච්ඡා සුවිශේෂී වශයෙන් සියුම් වෙනස්කම් දක්වයි.

## 4. ගැටුම් කළමනාකරණ න්‍යායයන් පිළිබඳ සන්දර්භය තුළ සංවාද ව්‍යාපෘතී

සංවාද ව්‍යාපෘතීවල සාර්ථකත්වය තක්සේරු කරන්නේ කෙසේද? මට්ටම් තුනකදී පූර්ව සාකච්ඡාමය සංවාද ව්‍යාපෘතීන් හි සාර්ථකත්වය තක්සේරු කිරීමේ ක්‍රමවේදයක් ක්‍රිස් මයිකල් විසින් යෝජනා කර ඇත (1993, 82, ff).

- අදාල පුද්ගලයන් මත බලපෑම් ඇතිකිරීම (ආකල්පයේ වෙනස්කම්, හැසිරීම් රටාවේ නව ප්‍රවණතා) ;
- අවසාන ඵලයට අදාළ විශේෂයෙන් ම අදහස්, යෝජනා, ප්‍රායෝගික පියවර වැනි කරුණු දේශපාලන අරමුණු සාධනය සඳහා එක්රැස් ක්‍රියාදාමයක් ලෙස ඒකාබද්ධ කළ යුතුය.
- සමස්ත අර්බුදය මත දිගුකාලීන බලපෑම්



මේ වන විට මෙය සමාජ මනෝවිද්‍යාව සහ කණ්ඩායම් ගතිකයන් පිළිබඳ තොරතුරු ලබාගත හැකි හොඳින් ස්ථාවර වූ පර්යේෂණ ක්ෂේත්‍රයක් ඇති බැවින් පළමු වැනි මට්ටම පිළිබඳව අදහස් දැක්වීම සාපේක්ෂ වශයෙන් සෘජු ස්වභාවයක් ගනී. කෙසේ වෙතත්, ප්‍රායෝගික වශයෙන් වැඩසටහන අවසානයේ දී එහි සහභාගිකයන්ට අදහස් දැක්වීමට ආරාධනා කිරීම තක්සේරු ක්‍රියාදාමයන්ට අදාළ වනුයේ. එහිදී බොහෝ විට ධනාත්මක අදහස් පිළිබඳ සන්නිවේදන වශයෙන් විශ්ලේෂණය නොකළ විශාල තොරතුරු සංඛ්‍යාවක් සැපයෙන බැවිනි. දෙවැනි හා තෙවැනි මට්ටම්වල තක්සේරු කිරීම් වලට බොහෝ විට පදනම් වන්නේ සංවිධායකයන් සහ අදාල අර්බුද කලාපවල සිටින ඔවුන්ගේ සහායකයන් විසින් පවත්වන ලද ප්‍රත්‍යෙක අධ්‍යයනයි. උදාහරණයක් වශයෙන් 1965 සහ 1995 අතර පැවති වැඩසටහන් සම්බන්ධව වාර්තාවන් 76 රොනල්ඩ් ෆිෂර් ඇගයීමට ලක් කළ අතර, ඉන් සියයට 84 ක සාර්ථකත්වයක් වාර්තා කෙරුණි (1997, 187 ff). කෙසේ වෙතත්, මෙවැනි ස්වයං තක්සේරුවක දී ඉදිරි කටයුතු පිළිබඳව පැවසෙන්නේ ඉතා සුළු තොරතුරු ප්‍රමාණයක් බව තේරුම් ගත යුතුය. එනම් දිගු කාලීන වශයෙන් බලපෑමක් ඇති කිරීම සඳහා කළ යුත්තේ කුමක්ද?, කිනම් ආකාරයේ පිරිසක් සමග ද? (කිනම් තෙවැනි පාර්ශ්වයක් සමග ද?), කිනම් අවස්ථාවකදී ද?, සාර්ථකත්වයක් ලබාගැනීම වනුයේ කුමන තලයක ද? වැනි ප්‍රශ්නවලට ලැබෙන්නේ ඉතා අඩු පිළිතුරු සංඛ්‍යාවක් පමණි.

මෙවැනි ප්‍රශ්නවලට කිනම් ආකාරයේ වපසරියක් තුළ වුව ද තනිකරම න්‍යායයන් හා ප්‍රායෝගිකයන් පදනම් වූ සංවාද ව්‍යුහයක් තුළින් විසඳුම් සෙවිය නො හැකිය. මෙය සාර්ව දේශපාලනමය අර්බුද කළමණාකරණ ක්‍රියාදාමයකට මගපාදනු ඇත (හොෆ්මාන් 1995).

සාමාන්‍යයෙන්, අන්තර් කණ්ඩායම් අර්බුද කළමනාකරණයක් ඉලක්ක කරගත් න්‍යායාත්මක පරීක්ෂණ මෙතෙක් දියුණු වී ඇත්තේ ඉතා දුර්වල ආකාරයෙනි. සැබෑ ගැටුම් තත්වයන් යටතේ ගතයුතු නිසි ක්‍රියාදාමයන් සම්බන්ධයෙන් ප්‍රායෝගික පළපුරුද්ද තුළින් ස්වභාවිකව පැන නැගී ආ ප්‍රබල ප්‍රශ්න රැසක් සඳහා තවමත් පිළිතුරු ලැබී නැත; සවිස්තරාත්මකව සිදුකෙරුණු න්‍යායාත්මක සාකච්ඡා සහ ඒවායේ ආනුභවික ප්‍රත්‍යක්ෂණය පදනම් කරගෙන මතුවී ඇති ප්‍රයෝජනවත් නිර්දේශ සංඛ්‍යාව ඉතා සුළුය. මේ සම්බන්ධයෙන් ලේඛනගත වී ඇති වඩාත් කැපී පෙනෙන තලයේ ප්‍රවේශයන් වන්නේ, ප්‍රාමාණික සංකල්ප වන "අපේක්ෂා උනන්දුව මත පදනම් වූ අර්බුද නිරාකරණය," (ෆිෂර් සහ ඌරිච් 1981), සංසන්දනාත්මක සිද්ධි අධ්‍යයන (සාර්ට්මාන් 1985). සහ සාමකාමී අන්දමින් සමථයකට පත්වී ඇතැයි පෙනෙන්නට තිබෙන අර්බුදයන්හි ගති ලක්ෂණ සම්බන්ධයෙන් පැවති ආනුභවික සහ ප්‍රමාණාත්මක ප්‍රත්‍යක අධ්‍යයන (බර්කෝවිච් සහ හූස්ටන් 1986) ය. සමාජ වෙනස්කම් හෝ අර්බුද න්‍යායයන් සම්බන්ධයෙන් පවතින ප්‍රත්‍යක සඳහන් කිරීම් මෙයට අදාළ වන්නේ නැත.

මැදිහත්වීමේ වැඩසටහන් සහ තනි පුද්ගල ක්‍රියාකාරකම්වල සාර්ථකත්වය මැන ගැනීම සඳහා වන මිණුම් දඬු සකස් කිරීමේ දී මෙම න්‍යායයාන්තර පරතරය විශේෂයෙන් දෘශ්‍යමාන වේ. ඒවායේ පවතින සමාජ සංකීර්ණභාවයන් නිසා ඉතා සූක්ෂම-උපාය සහ සාර්ව-ප්‍රතිවිපාක අතර සරල සහේතුක දැක්වීම අතිශයින් ම දුෂ්කරය. මේ නිසා මෙම පරතරය පිළිබඳ සලකා බැලීමට විශේෂ පියවර ගැනීමත් අර්බුද කළමනාකරණයේ ප්‍රායෝගිකතා සහ පර්යේෂණ පිළිබඳ විශාල කොටසක් ආවරණය කරමින් පවතින අප්‍රකාශිත උපකල්පන හුදෙකලා කොට පරීක්ෂණයට භාජනය කිරීම අත්‍යවශ්‍ය වේ (ක්ලෙයිබර් 1996ඃ රෝස් සහ රොත්මාන් 1996). අප මෙය සිදු කිරීමට අප අසමත් වුවහොත්, ආධිපත්‍ය සම්බන්ධතාවයන් තහවුරු කිරීම සමඟ හෝ (ප්‍රාන්සිස් 2003) සමාජ සම්බන්ධතා ඔපමට්ටම් කිරීම සමඟ සමපාත වීමේ නියත දැඩි අන්තරාවක් පවතී.



කෙසේ වෙතත්, මෑතක දී න්‍යායය හා භාවිතය අතර *ප්‍රතිසන්ධානයක්* අපට දිස් වේ. ක්‍රමානුකූලව සිදු කෙරුණු විමර්ශන සහ බලපෑම් තක්සේරු අධ්‍යයන බොහොමයක් තුළ මේ දක්නට ලැබුණි (ලුන්ඩ් සහ රස්මොලිනා 2000). මෙම අධ්‍යයන ඉලක්ක කෙරුණේ සංවර්ධන සහාය වැනි ස්ථාපිත ක්‍රියාකාරී ක්ෂේත්‍රවල අර්බුද කළමනාකරණ උපායයන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා නිර්ණායක සකස් කිරීම සඳහා ය.

ගැටුම් කළමනාකරණය සම්බන්ධ ප්‍රායෝගික සහ න්‍යායාත්මක ප්‍රවේශයන් දෙකම වර්ගීකරණය කරමින් කෝඩියුලා රේමාන් (මේ වෙළුම සඳහා ඇගේ දායකත්වය කියවන්න) අභීෂ්ට/ආදර්ශමය බෙදීම් තුනක් යෝජනා කර ඇත. සංවාද ව්‍යාපෘතීන්වල සංකල්පනාත්මක විශ්ලේෂණ වඩා හොඳින් කර ගැනීමටත් ඒවායේ සාර්ථකත්වය මැන ගැනීම සඳහා වන මිණුම් දඬු පිළිබඳවත් ඇගේ වර්ගීකරණය අදාළ වෙයි (කොටුව 1. බලන්න). එක් අංශයක ලබාගත් සාර්ථකත්වය අනෙක් අංශයන්ට සරල වශයෙන් යොදා නොගත හැකි බවට ඇගේ වර්ගීකරණයෙන් පැහැදිලි වෙයි.

උග්‍ර හෝ ප්‍රචණ්ඩ විභවයක් සහිත ගැටුම් හමුවේ දේශපාලන ක්‍රියාදාමය සකස් කිරීම හෝ සුරක්ෂිත කිරීම මෙන් ම බලයේ සිටින විවිධ කණ්ඩායම්වල නායකත්වයන්හි අවශ්‍යතාව සහ උනන්දුව

අතර ප්‍රබල සමබරතාවයක් ඇති කිරීම අර්බුද සමථකරණ ප්‍රවේශයන්හි අරමුණ වේ. මෙම රාමුව තුළ, උපදේශකයන් හා බලපෑම් කළ හැකි පුද්ගලයන් ගේ මට්ටම්වල ඇතිවිය හැකි නිල ගිවිසුම්වල ඉලක්කයන් මැන ගැනීමේ ක්‍රියාවලිය සඳහා සංවාද ව්‍යාපෘති ප්‍රයෝජනවත් විය හැකිය. මෙම සංවාද පිළිබඳ ප්‍රවේශ ඊට වඩා පුළුල් ආකෘතියකට ගෙන යා හැකි යැයි සැලකිය හැකි නම්, එමෙන් ම මාධ්‍යයෙන් කොටසක්වත් මේ සඳහා ධනාත්මක ප්‍රතිචාර දක්වයි නම්, මේ මට්ටමේ දී ගිවිසුම් සඳහා සුදුසු වාතාවරණයක් සකස් කළ හැකිය.

නිල සාකච්ඡා ක්‍රියාදාම පිළිබඳ සාමාන්‍ය වටපිටාව සමීක්ෂණයට භාජනය කළ ප්‍රත්‍යෙක අධ්‍යයන් ඇත්තේ ඉතා කුඩා සංඛ්‍යාවක් වන අතර ඒවායින් පෙන්නුම් කෙරෙන්නේ නිල මට්ටමට ඍජුව ම පරිවර්තනය වූ සිවිල් සමාජ සංවාද ව්‍යාපෘතීන් ඇත්තේ ඉතා සුළු සංඛ්‍යාවක් බවයි. සාමාන්‍ය සිවිල් පුරවැසියන් සහභාගී වන මෙවැනි ක්‍රියාදාමයන් පිළිබඳව නිල ප්‍රතිපත්ති සම්පාදකයන් තුළ ඇත්තේ මානසික සහ ක්‍රියාදාම මට්ටමෙන් සෑහෙන තරමින් බැහැර කොට සැලකීමකි. අනෙක් අතට, කරුණු සොයා බැලීම සඳහා විශ්වාසවන්ත පුද්ගලයකු ලෙස ජිමී කාටර් වැනි පරිණත රාජ්‍ය තාන්ත්‍රිකයෙකු පත්කිරීමෙන් ඇතිවන ගැටලු ඉතා අල්ප වෙයි. මේ නිසා සංවාද ව්‍යාපෘතීන් මගින් ඇතිවන බලපෑම වක්‍ර වන අතර සාපෙක්ෂ වශයෙන් දිගුකාලීන ද වේ. නායකත්ව විභවයෙන් යුත් පුද්ගලයන් සමාජගත කිරීම, පුද්ගලික සම්බන්ධතා ජාලයන් බිහි කිරීම, සහ ආරක්ෂිත ඒකාරාශීවීම්වලදී නව අදහස් මතුකිරීම මෙහි දී සිදු කෙරේ; මේ බව 1993 ඊශ්‍රායෙල පලස්තීන සම්මුතිය සඳහා යොමු කෙරුණු කෙල්මාන් භාවිත කළ පෙර සූදානම් පියවර මගින් මොනවට විදහා දක්වේ (කෙල්මාන් 1995).



## කොටුව 1 : ගැටුම් කළමනාකරණ සන්දර්භය සඳහා විවිධ ප්‍රවේශයන් සම්බන්ධයෙන් සංවාද ව්‍යාපෘතිවල කාර්යභාර්ය

| ගැටුම් කළමනාකරණ ප්‍රවේශය | ගැටුම් සංකල්පය | උචිත ප්‍රායෝගික ප්‍රවේශය | සාර්ථකත්වයේ ප්‍රමාණය | සංවාද ව්‍යාපෘතියේ කාර්යභාරය |
|---|---|---|---|---|
| ගැටුම් සමථය | ගැටුම් තරාතිරම රැකගැනීමේ හා දේශපාලන නියමය පිළිබඳ ගැටලුවක් ලෙස | පථ - 1 රාජ්‍යතාන්ත්‍රිකත්ව සහ නිල නායකත්ව මට්ටමේ බල දේශපාලනය | ප්‍රතිඵල නැඹුරු : ස්ථාවර කිරීමේ ප්‍රතිඵල අපේක්ෂිත දේශපාලන සමථකරණ | පෙර-ගිවිසුම් සංවිධානය<br><br>අවබෝධය පිළිබඳ දේශපාලන වාතාවරණයක් වර්ධනය කිරීම |
| ගැටුම් නිරාකරණය | ගැටුම සමාජ විපර්යාසයේ උත්ප්‍රේරකයක් ලෙස | පථ - 2 ඍජු සිවිල් සමාජ ගැටුම් කළමනාකරණය, විශේෂයෙන් මධ්‍යම ශ්‍රේණි නායකත්ව මට්ටමින් | ක්‍රියාදාම-නැඹුරු පක්ෂ අතර සන්නිවේදනය, අන්තර් ක්‍රියාකාරීත්වය සහ සම්බන්ධතාව; විවිධ සමූහිකත්ව අනන්‍යතාවලට ගරු කිරීම | සංවාද ශක්‍යතාව ඇති නායක පෙළැන්තියක් නිර්මාණය කිරීම<br><br>සන්නිවේදනය, ගැටලු විසඳීම ආදිය සඳහා වැඩමුළු |

| | | | | |
|---|---|---|---|---|
| ගැටුම් ව්‍යාවර්තනය | ගැටුම සමාජ සාධාරණය සඳහා අවිහිංසා අරගලයක් ලෙස | පථ - 3<br>ගැටුම හා ක්‍රියාත්මක වීමට, මැඩලීමට බෙලහීන කණ්ඩායම් වල හැකියා වර්ධනය කිරීම සහ යුද භීතියෙන්පෙළෙන සමාජ ඒකාබද්ධ කිරීම සඳහාහැකියාව වර්ධනය කිරීම | ව්‍යුහාත්මක නැඹුරු: අනන්‍යතා කණ්ඩායම් අතර සමාජ ආර්ථික විෂමතා දුරු කිරීම;<br><br>මනා රාජ්‍ය පාලනය;<br>බලය බෙදා ගැනීම;<br>සමාජ ව්‍යුහයේ පැතිකඩක් වන සේ සිවිල් සමාජ ව්‍යුහයක් ගොඩනැංවීම;<br>බිම් මට්ටමේ ගැටුම් කළමනාකරණ ශ්‍යකතා ගොඩනැගීම | සන්නිවේදනය සහ අන්තර් ක්‍රියාකාරීත්ව ශක්‍යතා ප්‍රගුණ කිරීම<br><br>ධ්‍රැවීකෘත කණ්ඩායම් අතර හමුවීම හා අධ්‍යයන අවස්ථා සඳහා ඉඩ සලසා දීම<br><br>කණ්ඩායම් බල ගැන්වුම |



නිල හා නිල නොවන රාජෝපාය මාර්ග අතර ඇති පරතරය, රාජ්‍ය හා සිවිල් සමාජය අතර පවතින දේශපාලන බලය පිළිබඳ අවස්ථා සහ නීත්‍යානුකූල භාවය අතර වෙනස්කම් විදහා දක්වන්නක් නොවේ. සංවාද පදනම් කරගත් ප්‍රවේශවලින් ගැටුම මූලික වශයෙන් වෙනස් අවබෝධයක් නිරූපණය කරන බව ඒ සම්බන්ධ කටයුතු කරන බොහෝ අය පවසති. ඔවුන්ගේ මතය අනුව දිග්ගැසුණු ගැටුම් යනු ආරක්ෂාව, පිළිගැන්ම සහ සහභාගීත්වය මෙන් ම සමාජ වෙනසක් සඳහා ඇති අවශ්‍යතාව (බර්ටන් 1990ඃ බර්ටන් සහ ඩියුක්ස් 1990) වැනි මූලික අවශ්‍යතා සපුරාලීමට නො හැකිවීම පිළිබඳ පැහැදිලි සංඥාවකි. එහිදී මෙම අන්තර්ගතයන් පිළිබඳව කටයුතු කිරීම පමණක් නොව පාර්ශ්වයන් අතර පවතින ගැටුම් සම්බන්ධතාවන් සම්බන්ධයෙන් ද කටයුතු කිරීම, ගැටුම් නිරාකරණයේ කාර්යභාරයයි. මෙ හිදී අරමුණ වන්නේ බෙදාහදාගත් ප්‍රශ්නයක් ලෙස ඒ හා ගනුදෙනු කිරීමේ හැකියාව ඇති කරමින් අර්බුදය නව සන්දර්භයක් කරා ගෙන ඒම යි.

අර්බුද නිරාකරණ ප්‍රවේශයන්හී දී සංවාද ව්‍යාපෘතීන් ඉතා වැදගත් මෙවලමක් වෙයි; එය එසේ වන්නේ මූලික වශයෙන්ම එහි මූලික අරමුණ වන්නේ, ආකල්ප සහ සම්බන්ධතා අන්‍යෝන්‍ය වශයෙන් පැහැදිලි කිරීමත්, සන්නිවේදනය දියුණු කිරීමත් වන නිසාය. බොහෝ සංවාද ව්‍යාපෘතීන් ඉතා කෙටිකාලීන කටයුතු බවට පත්වන අතර ඒවා දිගු කාලයක් පවත්වා ගත නොහැකිය. මෙය සාර්ථකව කළමනාකරණය කෙරුණු බොහෝ අවස්ථාවල සංවාදවල වටිනාකම පිළිබඳ දැනුමක් ඇති පිරිස මෙ මගින් බිහිවන අතර අනෙක් පාර්ශ්වය සමග සම්බන්ධකම් පවත්වා ගැනීමේ වැදගත්කම ඔවුන්ට වැටහී යාමෙන් ඉදිරි පියවර සඳහා සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකි ය. එසේ වෙතත්, මෙම ව්‍යාපෘතීන් බොහෝ විට සම්බන්ධතාවන්වල විස්තර දැන ගැනීම සඳහා වන ව්‍යාපෘතියක් ලෙස ඉදිරියට ගෙන යන්නේ කෙසේ ද, යන අභියෝගයට මුහුණපාන අතර, ගැටුම අර්බුදය පිළිබඳව විමර්ශනයක් සාමූහිකව ඉදිරියට ගෙන යා හැක්කේ පවතින ප්‍රශ්න විසඳා ගැනීමේ ප්‍රායෝගිකභාවය සම්බන්ධ පියවර ගැනීමෙනි.

ගැටුම් කළමණාකරණය පිළිබඳ තුන්වැනි ප්‍රවේශය ගැටුම් සමථකරණ සහ ගැටුම් නිරාකරණ විසඳාලීමේ සංකල්ප මත ඉදිවන නමුත්, ව්‍යුහාත්මක වෙනසක් පිළිබඳ අවශ්‍යතාව සඳහා අමතර ආතතීන් සපයයි. අර්බුද ව්‍යාවර්තන දෘෂ්ටි කෝණයෙන් බැලූ විට, යුද්ධයෙන් දැඩි ලෙස මානසික ආතතීන්ට ගොදුරු වූ සමාජයන්හි සහ දැඩිව බෙදී වෙන්වී ගිය සමාජයන්හි දිගුකාලීන සාම වැඩ පිළිවෙළක් සඳහා ඉතා පුළුල් පියවර රැසක් අවශ්‍ය වේ. ඒවා එක් අතකින් සමාජ ආර්ථිකමය අසමතුලිතතා ඉවත් කිරීමටත් අනෙක් අතින් (වාර්ගික) බහුවිධතාව හා කටයුතු කිරීමට හැකිවන පරිද්දෙන් දේශපාලන හා සමාජීය ශක්‍යතාවන් වර්ධනය කිරීමත් ඉලක්ක කරගත යුතුය. මෙම රාමුව තුළ සංවාද ව්‍යාපෘතින්ට, ඉතා වැදගත් "පාලම් ඉදිකිරීමේ ක්‍රියාදාමයක්" සිදු කළ හැකි ය. මෙම ක්‍රියා පටිපාටීන් ගණනය කළ යුතු නිර්ණායක වන්නේ එ මගින් අසාධාරණයට ලක්වී ඇති ජන කොටස ශක්තිමත් කිරීම සහ, එ මගින් කොපමණ අවස්ථා සැලසේ ද යන්න සහ පහළ බිම් මට්ටමේ සංස්කෘතීන්හි අර්බුදය විසඳාලීමට සඳහා අවශ්‍ය වෙනස්කම් සිදුවේ ද යන්නත් මගිනි. මෙහිදී පැන නැගෙන තවත් ප්‍රශ්නයක් වන්නේ මෙම සම්බන්ධතා ඇතිකිරීමට කෙරෙන කටයුතු මගින් ඒ සම්බන්ධ පුද්ගලයින්ගේ බලාධිකරණය සඳහා කොතෙක් දුරට දායක විය හැකිද යන්නයි.

මෙම වර්ගීකරණයෙන් පැහැදිලි වන්නේ, අරමුණු හා සන්දර්භය මත රඳා පවතිමින් මෙම සංවාද ව්‍යාපෘතීන්වල සාර්ථකත්වයේ විවිධාකාර උපායයන් භාවිතා කළ යුතු බවය. අර්බුද කළමණාකරණයේ සාමාන්‍ය ලක්ෂණයක් වන්නේ එහි සාර්ථකත්වය බහුවිධ හා බහු පැතිකඩ සහිත සංසිද්ධියක් බවයි. අර්බුද ව්‍යාවර්තනය වන්නේ එකට ක්‍රියාත්මක වන ප්‍රතිඵල-නැඹුරුව, ක්‍රියාදාම-නැඹුරුව සහ ව්‍යුහාත්මක-නැඹුරුව සහිත ප්‍රවේශයන් තුළින් යැයි යන උපකල්පනය අප පිළිගන්නේ නම්, මෙවැනි ව්‍යාපෘතීන් ද ක්‍රියාත්මක කළ යුතු වන්නේ විවිධ මට්ටම්වල දිවෙන සමාන්තර ක්‍රියාදාම කිහිපයකින් බව මෙහිදී පැහැදිලි ය. මේ හා සම්බන්ධයෙන් වඩාත් ප්‍රචලිතව දක්වන ආකෘතිය වන්නේ "සාම කොට්ඨාශ" හෝ "සාම සන්ධාන" යන සංකල්පයන් ය (ලෙඩ්රෙච්, 1997). මෙම සංවාද ව්‍යාපෘතීන් කෙතෙක් දුරට, කෙසේ සාම කොට්ඨාශ ගොඩනැගීමෙහි ලා දායක වන්නේ ද යන ප්‍රශ්නය මෙතෙක් පුළුල් වශයෙන් සාකච්ඡා වී නැත. මේ ප්‍රශ්නයට විසඳුම් සෙවීමෙහිලා එක් මාර්ගයක් උගත හැකි පාඩම් මගින් සපයා දී ඇති අතර එය එක් එක් සංවාද ව්‍යාපෘති මගින් සාකච්ඡා කළ යුතුය.



## 5 උගත් පාඩම්

දැනට පළවී ඇති සහ නොමැති පර්යේෂණ (ස්පෙන්සර් 1998: චාල්ස් ස්ටුවර්ට්ස් මොට් පදනම 1999: හෝමසෙන් රේඩ්මාචර් රොපර්ස් 2002: වොලේ 2002), අනුව  කෝකේසස් ප්‍රදේශයේ අර්බුදය නිරාකරණය කිරීම සම්බන්ධයෙන් වැඩමුළු පැවැත්වීමෙන් හා ඒ හා සම්බන්ධ ප්‍රශ්න විසඳීමට කර්තෘවරයාගේ ඇති පෞද්ගලික අත්දැකීම් මත පහත සඳහන් පාඩම් නවය ලැයිස්තුගත කළ හැකිය. බහු පාර්ශ්වීය දේශපාලන ක්‍රියාදාමයන් මත බලපෑම් ඇති කිරීම සඳහා වන ව්‍යාපෘතීන් මේ සම්බන්ධයෙන් අරමුණු කරගෙන ඇත.

- බොහෝ දිගුකල් පැවැති අර්බුදයක පාර්ශ්වයන් අතර සංවාද මාර්ගයෙන් ප්‍රශ්න විසඳා ගැනීමේ අධිෂ්ඨානය ළඟාකරගත හැකි වන්නේ *දිගුකාලීන ක්‍රියාවලි සහ ඉගෙන ගැනීම් රාමුවක්* තුළ කටයුතු කිරීමෙන් පමණි. පෞද්ගලික විශ්වාසය ගොඩනැගීම, ආකල්ප සහ ස්ථාවරයන් පැහැදිලි කර ගැනීම

සහ පසුබිම් කාරණා පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම පුළුල් සාකච්ඡාවක් සඳහා අවශ්‍ය වන මූලික අවශ්‍යතාවන් ය.

මෙහි දී අර්බුද ගැන ඒකාබද්ධ අයුරින් කටයුතු කිරීම ප්‍රධාන කාර්යභාරයක් ඉෂ්ට කරයි. උදාහරණයක් වශයෙන් කණ්ඩායම තුළ කටයුතු තීව්‍ර වීම සහ බැහැරින් ඇතිවන තර්ජන සහ වෙනත් බලපෑම් ගැන සිතා බැලිය හැකිය. මෙහිදී සෑම සාමාජිකයෙටකුට ම එක හා සමාන පිළිගැනීමක් සහ සිය වාස භූමිය පිළිබඳ ප්‍රශ්න ඇති බව පිළිගත යුතුය. එසේම සෑම සාමාජිකටයකුට ම කටයුතු සම්පාදනය කිරීම පිළිබඳව ධනාත්මක අත්දැකීම් තිබෙන්නට පුළුවන. සාකච්ඡාවල රහස්‍යගතභාවය පිළිබඳ ගිවිසුම් හෝ ප්‍රයෝගික ප්‍රශ්න සඳහා විසඳුම් ලබා ගැනීම් සම්බන්ධයෙන් ධනාත්මක අත්දැකීම් තිබෙන්නට පුළුවන. මේ නිසා මෙවැනි දිගුකාලීන ක්‍රියාදාමයක් සහතික කිරීමට තමන්ට හැකි දැයි, කටයුතුවලට මැදිහත් වන තෙවැනි පර්ශ්වයට සලකා බැලිය හැකිය. (ප්‍රායෝගිකව මෙය අවුරුදු කීපයක් පුරා දීර්ඝ කළ හැකිය.) මෙහි අයහපත් ම අවස්ථාව විය හැක්කේ, රැස්වීම් කීපයක් පමණක් හෝ බොහෝ විට එක් රැස්වීමක් පමණක්, පැවැත්වීමේ සම්භාවිතාව ඇති විට එහි දී ප්‍රශ්න බොහෝමයක් මතුවිය හැකි නමුත් මෙවන් අවස්ථාවක දී සහභාගීවන්නන් අතර ඇති අවිශ්වාසය, තිබුණාටත් වඩා වැඩි විය හැකිය.

- සංවාද ක්‍රියාදාමය ඉතා හොඳ ආරම්භයක් ගැනීමට නම් එයට *මූලින්ම සහභාගීවන්නන් තෝරා ගැනීම* ද තීරණාත්මකය. අර්ථාන්විත අදහස් හුවමාරුවක් වශයෙන් යම් ආකාරයක අවබෝධයක් ලබා ගැනීමට තමන්ට හැකි යැයි මෙම සහභාගී වන්නන් සහතික කළ යුතුය. මෙහි දී වඩාත් මධ්‍යස්ථ මතධාරී ප්‍රකාශකයෙකුගේ ප්‍රබල සහභාගීත්වය ඉතා වැදගත් ය. එසේම සහභාගීවන්නන් පළමු වටයේදී ම තෝරා ගැනීම මගින් මෙම ආයතන මෙම කටයුත්ත ඉතා බැරෑරුම් ලෙස සලකන්නේ ද? එසේත් නැත්නම් පිටස්තරයෙකුගේ හෝ පාවාදෙන්නෙකුගේ ආගමනයක් ලෙස ප්‍රතික්ෂේප කරන්නේ ද යන්න පිළිබඳ සංඥාවන් සපයනු ඇත. මේ නිසා මෙහි පළමු අදියරේ දී මධ්‍යස්ථ මතධාරී සහ ඉතා හොඳින් ප්‍රමුඛ පෙළේ පුද්ගලයන් සමග සම්බන්ධතා පවත්වන අයගේ මිශ්‍රණයක් ඇති කිරීමෙන් බලාපොරොත්තු ප්‍රතිඵල ලබාගත හැකිය. එසේම ක්‍රියාදාමයේ මැදභාගයට එළඹෙද්දී දැඩි මතධාරීන් එයට එක්කරගන්නේ කෙසේදැයි යන්න සොයා බැලිය යුතුය. 'එක්කර ගැනීම' යනුවෙන් අදහස් කරන්නේ යාන්ත්‍රික ව රැස්වීම්වලට සහභාගීවීම යන්න නොවේ; මූලික වශයෙන් දැඩි මතධාරීන් ඔවුන්ගේ ප්‍රතික්‍රියාවන් සහ ආකල්ප පිළිබඳ මූලික සාකච්ඡාවකට මුසුකර ගැනීම මෙයින් අදහස් කෙරේ. ප්‍රචණ්ඩත්වයට යොමු වී සිටින පුද්ගලයන් කිසි විටෙකත් මෙම සංවාද හා සම්බන්ධ කර ගැනීම සුදුසු නොවේ. කෙසේ වෙතත්, කඩාකප්පල්කාරීත්වයට සහ ප්‍රතිවිරෝධතා දැක්වීමට ඔවුන්ට ඇති හැකියාව නිවැරදිව හඳුනා ගැනීම වැදගත්ය.



සංවාද ව්‍යාපෘතීන් මත බලපවත්වන අභියෝගයන් බොහෝ විට සාමාන්‍ය පහසුකම් සැපයීමේ මාර්ගයන් වන සන්නිවේදන තාක්ෂණයන් සහ වෙනත් සාධක මත රඳා නොපවතී. මෙය සාමාන්‍ය විශ්වාසයට පටහැනිය. එමෙන් ම එය සාමාන්‍ය සංවිධානාත්මක අන්තර්ගතයක දී අවශ්‍ය වන මූල්‍ය, සූදානම් වීම් සහ සැසිවාරයන් පැවැත්වීම වැනි සංවිධානාත්මක අවශ්‍යතාවන්ට වඩා අඩුය. වගකිව යුතු අධිකාරීන් හෝ බලයේ සිටින්නන් විසින් ක්‍රියාකාරී බාධකයක් නො පැනවුවහොත් බොහෝ

ලෙස බෙදී වෙන්වී ගිය සමාජයක සංවාද ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේ නිවේදනය දැනුම් දුන් විට එය අවිශ්වාසය සහ ප්‍රතික්ෂේප කිරීමකට මුහුණ දෙනු ඇත.

මේ නිසා මෙවැනි හමුවීම් අදාළ රටෙන් පිට ස්ථානයක පැවැත්විය යුතු අතර ඒ සඳහා ඉහළ තලයේ සංවිධානාත්මක සහ මූල්‍ය යෙදවුම් අවශ්‍ය වේ. මෙවැනි හමුවක් සංවිධානය කිරීම සඳහා තෙවැනි පාර්ශ්වයට බොහෝ විට දෙපාර්ශ්වය සමග ම විවිධාකාර මට්ටමේ සාකච්ඡා පැවැත්විය හැකිවන අතර අවම වශයෙන් යෝජිත සහභාගී ලැයිස්තුවට සහ වැඩසටහනට එකඟතාවන් ලබා ගැනීම ද සිදු කළ යුතුය. මෙම ප්‍රවේශයන්හි අදාළත්වය රඳා පවතින්නේ සාකච්ඡාවන්හි දී ඒවා බොහෝ විට අඩු වටිනාකමක් ලැබුණ ද, එම ක්‍රියාදාමයන් පුළුල් සංවාද ක්‍රියාදාමයක අඩංගු කොටස් ලෙස සැලකිය යුතුය.

- ඕනෑම මැදිහත්වීම් ක්‍රියාදාමයක් අදහස් කළ හා නොකළ ප්‍රතිඵල සහිත ය. මේ නිසා සංවාදමය ව්‍යාපෘතීන් ආරම්භ කරන්නන් එම ප්‍රතිඵල සම්බන්ධයෙන් හා ඒවායේ ක්‍රියාකාරීත්වයන් සම්බන්ධයෙන් ප්‍රවේශම්වීමට සදාචාරාත්මක වගකීමක් දැරිය යුතුය. විශේෂයෙන් එම ප්‍රතිඵල අනපේක්ෂිත සහ කලින් දැක නැති ඒවා වන අතර අවම සම්භාවිතාවක සිට උපරිම සම්භාවිතාවක් දක්වා දිව යා හැකිය. බොහෝ කාර්යයන්වලට වඩා පළමුවෙන්ම කළ යුත්තේ රැස්වීම්වලට සහභාගී වන්නන් මත එල්ලවන ආරක්ෂක තර්ජන අවම කිරීමට පියවර ගැනීමයි. උදාහරණයක් වශයෙන්, ඉතා දැඩි වශයෙන් අසමමිතිකභාවයක් පෙන්නුම් කරන අර්බුදවලදී සංවාදවලට සහභාගී වන දුර්වල කණ්ඩායම බොහෝ විට දැඩි රැඩිකල් ස්වභාවයක් ගනී. අවසාන වශයෙන් නියමාකාර අර්බුදයකට තෙවැනි පාර්ශ්වයක් මැදිහත් වන්නේ නම් එම පාර්ශ්වය සිය බහු පාර්ශ්වීය පක්ෂග්‍රාහී භාවය පවත්වාගෙන යනු දක්නට හැකිය. ප්‍රශ්නයට හොඳින් මුහුණ දිය යුතුය. විශේෂයෙන් ම එක් පාර්ශ්වයක් හෝ තවක් පාර්ශ්ව කිහිපයක් විසින් විශාල ප්‍රමාණයේ මානව හිමිකම් උල්ලංඝනයක් හා වැඩි ප්‍රමාණයේ මානව හිමිකම් උල්ලංඝනයක් හා ක්‍රියා කරන විට මේ තත්ත්වය වැදගත් ය.

- සාමාන්‍යයෙන්, මෙම අන්තර් ක්‍රියාකාරී, ගැටුම් නිරාකරණ ව්‍යාපාරය විශේෂ ආකාරයක ප්‍රශ්න විසඳීමේ වැඩසටහනක ආධිපත්‍යයට නතු වී ඇත. එය සිදුවන්නේ ශාස්ත්‍රීය විශ්ලේෂණයන් සහ ඇතැම් විට දැඩි මතධාරී ආරම්භකයන්ගේ ශෛලියට අනුගතව ය. (ෆිෂර් 1997). කෙසේ වෙතත් අපට මෙතෙක් ළඟා කරගැනීමට හැකි වූ ඉතා පුළුල් පරාසයක පවතින අත්දැකීම් හා සසඳා බලන විට සංවාද ව්‍යාපෘතීන් කෙරේ *මැදිහත්වීමේ ක්‍රමවේදය* සකස් කිරීමේ දී ඉතා පුළුල් හා නම්‍යශීලී පදනමක් යටතේ පිහිටා කටයුතු කිරීම වඩා උචිත ය. විශේෂයෙන් ම වැඩිහිටි අධ්‍යාපනය, අන්තර් සංස්කෘතික අධ්‍යයන, කණ්ඩායම් ගතිකයන්, උපදේශනය , අධීක්ෂණ සහ මැදිහත්වීම් අංශවලින් ලබාගත් අත්දැකීම්, ක්‍රියාශීලී සංවාදයක් නිෂ්පාදනය කිරීම සඳහා යොමු කිරීම වැදගත්ය. මේ ක්‍රියාදාමය ඇරඹෙන්නේ කණ්ඩායමේ නියමාකාර සංයුතිය පිළිබඳ ප්‍රශ්න සහ ඒ සමගම කණ්ඩායම විසින් ම මතුකරගන්නා ලද අර්බුදයන්ට මුහුණ දී සිටින අවස්ථාවක, එම කණ්ඩායමේ හැසිරීමෙන් ඇතිවන ප්‍රතිමානීය කාරණා පිළිබඳව පරීක්ෂණ කිරීමෙන්ය. කණ්ඩායම් ගතිකය තුළ පවත්නා විවිධ රැළි පිළිබඳ ව කරුණු අනාවරණය කිරීම් ද දිගට ම කෙරීගෙන යයි. මෙය වැදගත් වන්නේ, *ප්‍රතිසන්ධානගත වීමට* එරෙහි වීම, හදිස්සියේ දැඩිමත ගැනීම හෝ අලුත් ප්‍රශ්න

මතු කිරීම වශයෙන් යටපත් ව ඇති තත්වයන් සංවාදයේ දී මතුවිය හැකි බැවිනි. අවසාන වශයෙන් මෙම සංවාද කොපමණ ප්‍රමාණයක් හෝ කොපමණ අඩු ප්‍රමාණයක් ප්‍රශ්නය විසඳීමේ න්‍යායයන් හරිහැටි අවබෝධ කර ගැනීමේ ක්‍රියාමාර්ග පිළිබඳව ගත යුතු යැයි යන ප්‍රශ්න ද සැලකිල්ලට ගනී.

- සංවාදයට සහභාගී වන්නවුන් අතර ඇති ආකල්ප වෙනස් කිරීම සඳහා නිතර යොදාගන්නා ක්‍රමවේදයක් වන්නේ ඒ හා *සමාන වාර්ගික දේශපාලන අර්බුදයක් සම්බන්ධයෙන්* මෙනෙහි කිරීමට අ ව ස් ථා ව ලබාදීම සහ මෙ මගින් ලබාගත හැකි ආදර්ශයන් පිළිබඳව සොයා බැලීමත් ය. මෙහි දී වැදගත් වන තවත් අදහසක් වන්නේ සියලු ආකාරයෙන් සම්බන්ධ පාර්ශ්වයන්ගේ අදහස් තේරුම් ගැනීම සාමාන්‍යයෙන් පහසු බවත්, සමස්ත තත්ත්වය සම්බන්ධයෙන් අවම අගතියක් ලබා ගැනීමත් ය. මෙසේ සිදුවන්නේ තමන්ගේ නොවන වෙනත් අර්බුදයක් සලකා බැලීමේදී ය. මෙ මගින් තමන්ගේම අර්බුදයේ නව පැතිකඩ කැඩපතක ඡායාමෙන් හඳුනා ගැනීමට හැකි වේ. වඩාත් උචිත වන්නේ කටයුතු වඩාත් පරිණත අවධියක පැවතීම වන අතර එවිට තමන්ගේ ගැටුම සඳහා වඩාත් ගැළපෙනුයේ කෙබඳු සමථකරණ අංග දැයි තීරණය කර ගත හැකි වේ. කෙසේ වෙතත් ක්‍රියාදාමය සාමාන්‍යයේ මේ කියන ආකාරයට ම සුමුදු නැත. සංසන්දනාත්මකව කරුණු සෙවීමට දරණ ප්‍රයත්නයන් තුළින් සිය අත්‍යවශ්‍ය ඉලක්කයන් සපුරා ගැනීමේ දී බාධාවක් වෙති යි සලකන මෙයට සහභාගී වන්නෝ සිය ගැටුමේ ඇති සුවිශේෂිභාවයක් ගෙනහැර දක්වති. කෙසේ වෙතත්, මෙම අත්හදා බැලීම් ඕනෑම සංවාද ක්‍රියාදාමයක් තුළ ලබාගත හැකි වැදගත් ම ප්‍රත්‍යාවලෝකනමය ඉලක්කයන් වන නිසා ඔවුහු මෙමු අත්දැකීම් ඉතා වැදගත් කොට සලකති.



- කලින් සඳහන් කළ පරිදි සංවාද ව්‍යාපෘතියක සාර්ව දේශපාලනමය බලපෑම් තක්සේරු කිරීම ඉතා අපහසුය. මේ නිසා *මධ්‍යම සමාජීය මට්ටමෙන්* මෙම ක්‍රියාදාමයේ බලපෑම සොයා බැලීම ඉතා වැදගත් ය. මෙහි සාර්ථකත්වය රඳා පවතින එක් කාරණයක් වන්නේ සාකච්ඡා ක්‍රියාදාමයේ අයිතිය පිළිබඳව සහභාගී වන්නන්ට සහ ඔවුනොවුන්ට එදිරිව සිටින කණ්ඩායම්වලට සංවිධාන මට්ටමෙන් කොපමණ දුරක සාර්ථකත්වයක් ලබා දීමට මැදිහත්කරුවන් සමර්ථ වේද යන්න මතයි. ආකල්පයන් සහ තත්ත්වයන් මෙන් ම අවස්ථා ද පැහැදිලි කර ගැනීම සඳහා මෙම සංවාද හා සම්බන්ධ අවස්ථා ක්‍රමානුකූලව ඒකාබද්ධ කිරීමටත් එ මගින් පොදු මට්ටම් හඳුනා ගැනීමටත් ඇති විකල්ප මාර්ග ඔවුන් විසින් විශ්ලේෂණය කරනු ලබන්නේ ද?

සම්මන්ත්‍රණ සංවිධානය කිරීමේ දී සහභාගී වන්නන්ගේ මැදිහත්වීමේ මට්ටම ඉහළ දැමීමෙන් පමණක් මෙම අරමුණු කරා ළඟාවිය නොහැකිය. මෙම සංවාද සැසිවාර දීර්ඝ කිරීමත්, මූලික සහ පසු විපරම් ක්‍රියාකාරීත්වයන් සඳහා ද ඉඩකඩ සැලැස්වීමෙන් මෙය දියත් කිරීමත්, මේ සඳහා අවශ්‍ය කෙරේ. මෙ මගින් බලාපොරොත්තු වන්නේ කේවල මාතෘකා පිළිබඳ ව වඩාත් ගැඹුරින් අධ්‍යයනය කිරීම සහ සහභාගී වන්නන්ගේ හැකියා වර්ධනය කිරීමයි. මෙය සිදුකළ හැකි යාන්ත්‍රණය වන්නේ දේශීය සහාය සපයන වැඩමුළු, ක්‍රියාකාරී කණ්ඩායම් සහ පුහුණු සැසිවාරයන් ය. සාර්ථකත්වය ලබාගත හැකි තවත් ක්‍රියාමාර්ගයක් වන්නේ සහභාගීත්වය පිළිබඳ 1-පථයට ආසන්න රාමුව පුළුල් කිරීම වැනි කාරණා මත ය. මෙහිදී සහභාගීත්වය වැඩි කළ යුතු වන්නේ ඒ සඳහා සහභාගී වන සංඛ්‍යාවන් මත හෝ එවැනි ම

වූ ප්‍රවේශයන් නැවත නැවතත් සිදු කරන්නේ නම් ය. ප්‍රයෝගික වශයෙන් අර්බුද සමථයකට පත් කිරීම සඳහා නව ප්‍රවණතාවයක් සපයන නියම ජනතාව අතර සහ එමෙන් ම චක්‍රය පුළුල් කරන ක්‍රියාදාමයන් මත සුදුසු ශ්‍රම බලකායක් රඳා පවත්වා ගැනීම මෙහි අරමුණයි.

- යුද්ධයෙන් මානසික පීඩාවට පත්ව සිටින සමාජ සහ විභින්න සමාජ තුළ සිය කටයුතු සහ ප්‍රතිඵල ආයතනගත කරන්නේ කෙසේ ද යන ප්‍රශ්නයට මුහුණදීමට සංවාද ව්‍යාපෘතියකට ඉක්මනින් හෝ පසුකාලීනව සිදුවේ. බොහෝ විට සිදුවන්නේ තෙවැනි පාර්ශ්වයන් මූලික කොටසේ දී තබන ලද තාවකාලික සමුළු මගිනි. මෙවැනි ආයතනගත ස්ථාපිත කිරීමක් නොකළ හොත් සංවාද ව්‍යාපෘතියේ මූලික ධනාත්මක පියවර කැඩී බිඳීයාමේ සැබෑ තර්ජනයක් පවතී. සංවාද ආයතනගත කිරීම විවිධාකාර අන්දමකින් සිදුකළ හැකි අතර ඒවා අර්ධ-රාජ්‍ය, අන්තර්-වාර්ගික කොමිසම්වල සිට ඒකාබද්ධ කාර්යසාධක බලකායන් හරහා බහු වාර්ගික රාජ්‍ය නොවන සංවිධාන දක්වා දිව යා හැකිය.
- එහෙත්, සංවාද ව්‍යාපෘතීන්ට සිදු කළ හැකි වඩා වැදගත් සංකල්පනාත්මක දායකත්වය වන්නේ, *සාකච්ඡා පදනම් වූ අර්බුද සංස්කෘතියක ප්‍රවර්ධනය* කිරීමේ ලා සාම කලාප හෝ සාම සන්ධානයක ගොඩනැගීම මගිනි. මෙයින් කියැවෙන්නේ මුලින් සඳහන් කළ අපෙක්ෂා පදනම් ධනාත්මක සංවාදවල මූලික ප්‍රභේද ඉතා කුඩා ප්‍රමාණයක් අන්තර් කණ්ඩායම් ව්‍යාපෘති ධනාත්මකව ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගැනීම නොව දේශපාලන සංස්කෘතියේ මූලික අංගයක් බවට පත්කිරීම ය. එය මැද පෙරදිග වැනි බොහෝ වාර්ගික දේශපාලනමය අර්බුදවලට නිදසුනක් වෙයි. ඉතා ප්‍රවර්ධනාත්මක සංවාද ක්‍රියාදාමයක් අර්බුදයට සම්බන්ධ පාර්ශ්ව අතර පවතින තාක් කල් ව්‍යාවර්තනය නියමාකාරයෙන් පැවතීම බොහෝ දුරට සිදුවිය හැක්කකි.



## 6. ආශ්‍රිත ග්‍රන්ථ

Apel, Karl-Otto 1990. *Diskurs und Verantwortung,* Frankfurt: Suhrkamp.

Bar-On, Dan 2000. *Den Abgrund überbrücken: Mit persönlicher Geschichte politischen Feindschaften begegnen,* Hamburg: Edition Koerber.

Bercovitch, Jacob (ed.) 1996. *Resolving International Conflicts. The Theory and Practice of Mediation,* Boulder: Lynne Rienner.

Bercovitch, Jacob & Allison Houston 1996. "The Study of International Mediation: Theoretical Issues and Empirical Evidence," *in* Bercovitch, op. cit., 11-35.

Bercovitch, Jacob & Jeffrey Z. Rubin (eds.) 1992. *Mediation in International Relations,* London: Macmillan.

Burton, John 1990. *Conflict: Resolution and Provention,* London: Macmillan.

Burton, John & Frank Dukes (eds.) 1990. Conflict: Readings in Management & Resolution, London: Macmillan

Charles Stewart Mott Foundation 1999 *Reaching for Peace: Lessons Learned from Mott Foundation´s Conflict Resolution Grantmaking,* 1989-1998, Evaluation conducted by CDR Associates and the Berghof Research Center for Constructive Conflict Management, Flint, Michigan: Charles Stewart Mott Foundation.

Fisher, Roger and William Ury 1981. *Getting to Yes,* Boston, Ms: Houghton Mifflin.

Fisher, Ronald J. 1997. *Interactive Conflict Resolution,* Syracuse, NY: Syracuse University Press.

Haumersen, Petra, Helmut Rademacher and Norbert Ropers 2002. *Konfliktbearbeitung in der Zivilgesellschaft. Die Workshop-Methode im rumänisch-ungarischen Konflikt,* Münster: LIT.

Hoffman, Mark 1995. "Defining and Evaluating Success: Facilitative Problem-Solving Workshops in an Interconnected Context," *Paradigms: The Kent Journal of International Relations*, 9, 2, 150-67.

Kelman, Herbert C. 1992. "Informal Mediation by the Scholar/Practitioner," in Bercovitch and Rubin, op. cit., 64-95.

Kelman, Herbert C. 1994. "Promoting Joint Thinking in International Conflicts: An Israeli-Palestinian Continuing Workshop," *Journal of Social Issues,* 50, 1, 157-78.

Kelman, Herbert C. 1995. "Contributions of an Unofficial Conflict Resolution Effort to the Israeli-Palestinian Breakthrough," *Negotiation Journal*, January 1995, 19-27.

Kleiboer, Marieke 1996. "Understanding the Success and Failure of International Mediation," *Journal of Conflict Resolution,* 40, 2, 360-89.

Lederach, John Paul 1997. *Building Peace: Sustainable Reconciliation in Divided Societies,* Washington, DC: United States Institute for Peace.

Lund, Michael and Guenola Rasamoelina (eds.) 2000. *The Impact of Conflict Prevention Policy: Cases, Measures, Assessments,* Baden-Baden: Nomos.



McCartney, Clem 1986. "Human Rights Education," in *11th Annual Report. Standing Advisory Committee on Human Rights,* London: HMSO.

Miall, Hugh, Oliver Ramsbotham and Tom Woodhouse 1999. *Contemporary Conflict Resolution,* Cambridge: Polity.

Mitchell, Christopher 1993. "Problem-Solving Exercises and Theories of Conflict Resolution," in Sandole and van der Merwe, op. cit., 78-94.

Mitchell, Christopher & Michael Banks 1996. Handbook of Conflict Resolution: The Analytical Problem-Solving Approach, London: Pinter.

Otten, Hendrik & Werner Treuheit 1994. *Interkulturelles Lernen in Theorie und Praxis: Ein Handbuch für Jugendarbeit und Weiterbildung,* Opladen: Leske und Budrich.

Reychler, Luc & Thania Paffenholz (eds.) 2000. Peacebuilding: A Field Manual, Boulder, Co: Lynne Rienner.

Ross, Marc Howard & Jay Rothman (eds.) 1999. Theory and Practice in Ethnic Conflict Management: Theorizing Success and Failure, London: Macmillan.

Rothman, Jay 1998. "Dialogue in Conflict: Past and Future," in Eugene Weiner, op. cit., 216-235.

Sandole, Dennis J.D. & Hugo van der Merwe (eds.) 1993. *Conflict Resolution. Theory and Practice: Integration and Application,* Manchester: Manchester University Press.

Spencer, Tanya 1998. *A Synthesis of Evaluations of Peacebuilding Activities Undertaken by Humanitarian Agencies and Conflict Resolution Organisations,* London: Overseas Development Institute.

Weiner, Eugene (ed.) 1998. *The Handbook of Interethnic Coexistence,* New York, NY: Continuum.

Wimmer, Andreas, Richard Goldstone, Donald Horowitz, Ulrike Joas, and Conrad Schetter 2003.

*Facing Ethnic Conflicts: Perspectives from Research and Policy-making* (forthcoming).

Wolleh, Oliver 2002. *Möglichkeiten und Grenzen interner Akteure bei der Friedensbildung in geteilten Gesellschaften. Die Conflict Resolution Trainer Group in Zypern (1993-1997),* Berlin: LIT.

Zartman, I. William 1985. Ripe for Resolution: Conflict and Intervention in Africa, New York, NY: Oxford University Press.